**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය I කොටස - 2021**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ - I කොටසේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2019 මාර්තු 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීනයේ ආනයන හා අපනයන බැංකුව අතර එළඹි අංක (2018) 17 එකතු අංක.(474) ණය ගිවිසුමේ 4 වාවස්ථාවේ 4.6 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, මාර්ග සංවර්ධන හා ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කඩවත සිට මීරිගම දක්වා අධිවේගී මාර්ගයක් ඉදිකිරීමෙන් දැනට පවතින අධිවේගී මාර්ග ජාලය කි.මී. 36.98 කින් වැඩි කිරීම මගින් කලාප අතර ඉහළ සංචලතාවයක් ඇති කිරීම තුළින් ආරක්ෂාව වැඩි කිරීම මෙන්ම ගමන් කාලය, රථවාහන තදබදය, වාහන මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සහ පරිසර දූෂණය අඩු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන 176,785 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,299.29 ක් වූ අතර ඉන් රු. මිලියන 134,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 989.45 ක් මූල්‍යනය කිරීමට චීනයේ ආනයන හා අපනයන බැංකුව එකඟ වී තිබුණි. රු.මිලියන 42,157 කට සමාන එ.ජ.ඩො. මිලියන 309.83 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කළ යුතුය. ව්‍යාපෘතියේ කටයුතු 2020 සැප්තැම්බර් 15 දින ආරම්භ කර තිබුණු අතර 2024 සැප්තැම්බර් 14 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ සම්පූර්ණ ශක්‍යතා අධ්‍යයනය සඳහා රු. මිලියන 2,193 ක මුදලක් වැය කර තිබුණද, එම වියදමින් අදාළ කොටස මෙම ව්‍යාපෘතියට වෙන් කර නොතිබුණු අතර එබැවින් ව්‍යාපෘතියේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී එම මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | වියදමින් අදාළ කොටස ව්‍යාපෘතියේ වියදමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව සියලු අරමුදල් මූලාශ්‍ර ශුද්ධ වත්කම්/හිමිකම් යටතේ මූල්‍ය තත්ත්වය තුළ දැක්විය යුතු වුවද, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු. මිලියන 150 ක අරමුදල් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු රු. මිලියන 150 ක අරමුදල් නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර ශුද්ධ බලපෑමද ගිණුම්වල ගලපා ඇත. කෙසේ වෙතත්, මෙම ගැලපීම මූල්‍ය තත්ත්වය විකෘති කිරීමට ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව අරමුදල් මූලාශ්‍ර ගිණුම්ගත කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩවත සිට කොස්සින්න දක්වා වූ පැකේජ 01 කොන්ත්‍රාත්තුව 2016 ජුනි 20 දින අත්සන් කරන ලද අතර වැඩ ආරම්භ කිරීම 2020 සැප්තැම්බර් 15 දක්වා ප්‍රමාද විය. තවද, කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත අවසන් දිනය 2023 මාර්තු 14 වනු ඇත. ආරම්භ වූ දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාස 15 ක් ගතව තිබුණද, තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 30.53 ක් වූ ඉලක්කයෙන් සියයට 15.07 ක් පමණක් විය. | කොන්ත්‍රාත්කරුගේ කාර්ය මණ්ඩලයට කොවිඩ් ආසාදනය වීම, රට අඛණ්ඩව වසා දැමීම, ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාළ පාර්ශව සම්බන්ධ කර ගැනීමේ දුෂ්කරතා, අමුද්‍රව්‍ය හිඟය, ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය විවිධ භාණ්ඩ ආනයනය කිරීමේ දුෂ්කරතා, මහජන විරෝධතා සහ අයහපත් කාලගුණය හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වය ආදිය පැකේජ දෙකෙහි භෞතික ප්‍රගතිය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය නිසි පරිදි නිම කිරීමට ඉලක්කගත ප්‍රගතියක් ලබා ගැනීම සඳහා සියලු උත්සාහයන් ගත යුතුය. |
| (ආ) | කොස්සින්න සිට මීරිගම දක්වා පැකේජ 02 හි කොන්ත්‍රාත්තුව 2015 අගෝස්තු 04 දින අත්සන් කරන ලද අතර වැඩ ආරම්භ කිරීම 2020 සැප්තැම්බර් 15 දක්වා ප්‍රමාද විය. තවද, කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත නිම කිරීමේ දිනය 2024 සැප්තැම්බර් 14 දින වේ. ආරම්භක දින සිට 2021 දෙසැම්බර් 31 දිනට මාස 15 ක් ගත වුවද, තත්‍ය භෞතික ප්‍රගතිය සියයට 30.46 වූ ඉලක්කයෙන් සියයට 20.54 ක් පමණක් විය. | කොන්ත්‍රාත්කරුගේ කාර්ය මණ්ඩලයට කොවිඩ් ආසාදනය වීම, අමුද්‍රව්‍ය හිඟය, විවිධ ද්‍රව්‍ය ආනයනය කිරීමේ දුෂ්කරතා, මහජන විරෝධතා සහ ගංවතුර තත්ත්වයන් ආදිය පැකේජ දෙකෙහි භෞතික ප්‍රගතියේ අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය නිසි පරිදි නිම කිරීමට ඉලක්කගත ප්‍රගතියක් ලබා ගැනීම සඳහා සියලු උත්සාහයන් ගත යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු අධිවේගී මාර්ගයේ 04 පැකේජය සහ 07 පැකේජය ඉදිකිරීම යටතේ දරන ලද වියදම් ගෙවීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව 2015 ජූලි 16 දිනැති කැබිනට් තීරණ අංක. 15/1021/602/040 යටතේ රු. මිලියන 158,386 කට මධ්‍යම අධිවේගී මාර්ග I කොටසේ කොන්ත්‍රාත්තුව චයිනා මීටලොජිකල් ගෲප් කෝපරේෂන් (MCC) වෙත පිරිනැමීමට අනුමැතිය ලබා දී තිබුණි. | මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් පත් කරන ලද කමිටුව විසින් ලබා දුන් නිර්දේශය මත එම තීරණය ගෙන ඇත. | රජයට ලැබෙන ආර්ථික ප්‍රතිලාභය උපරිම කිරීම සඳහා පිළිගත් ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ සිවිල් වැඩ සඳහා අරමුදල් 2019 මාර්තු 21 දින අත්සන් කරන ලද ණයක් ලෙස චීනයේ EXIM බැංකුව විසින් සපයනු ලැබේ. කෙසේ වෙතත්, ණය මුදල 2021 දෙසැම්බර් 31 දක්වා ලබා දී නොතිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් මිල උච්චාවචනයන් සඳහා පැකේජ 01 සහ 02 වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 470.62 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතුව තිබුණි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන්, අතුරු ගෙවීම් සහතික ගෙවීම ප්‍රමාද වීමට මෙම ප්‍රමාදය හේතු වී තිබුණු අතර එම කාලය තුළ සිදුවූ මිල උච්චාවචනයන් සඳහා කොන්ත්‍රාත්කරු ගෙවීම් ඉල්ලුම් කර තිබුණි. | ව්‍යාපෘතියේ අමතර වියදම් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර අරමුදල් සම්පාදනයන් විධිමත්ව සැළසුම් කළ යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 4.2 උප වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ නිසි කාර්ය සාධනය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වියදමින් කාර්ය සාධන ඇපකරයක් ලබා ගත යුතු වුවද, ඉහත කොන්දේසියට පටහැනිව ව්‍යාපෘතිය විසින් ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පැකේජ දෙක සඳහා එකතු වටිනාකම රු. මිලියන 805.43 ක් ගෙවා තිබුණු අතර එය කොන්ත්‍රාත්කරුට අනවශ්‍ය වාසියක් වනු ඇත. | කාර්ය සාධන ඇපකරයේ පිරිවැය වෙනම ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට ඉඩ නොදෙන්නේ නම්, ඔහුට එය වෙනත් ගාස්තුවලට ඇතුළත් කිරීමට අවස්ථාවක් ඇති අතර එමඟින් ගාස්තු අසාමාන්‍ය ලෙස ඉහළ යෑමෙන් කොන්ත්‍රාත් මුළු පිරිවැය වැඩිවීමක් සිදුවනු ඇත. | ලංසු ලේඛණ නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |
| (ඈ) | නියමු මාර්ගය සඳහා ජල විද්‍යා අධ්‍යයනයක් සිදුකිරීම සඳහා රු. මිලියන 4.5 කට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLRDC) සමඟ 2017 මාර්තු 14 දින ගිවිසුමක් අත්සන් කර තිබුණු අතර අත්තිකාරම් ගෙවීම් ලෙස රු. මිලියන 2 ක මුදලක් 2017 ජූලි 24 දින ගෙවා තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 24 ක් වන අතර එය 2021 දෙසැම්බර් 31 දිනට වසර 2 කට වැඩි කාලයකින් ඉකුත් වී තිබුණද, අවසන් වාර්තාව ව්‍යාපෘතියට ලැබී නොතිබුණි. | ගිවිසුමේ 10.5.II වගන්තිය අනුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් අවසන් වාර්තාව ව්‍යාපෘති කාර්යාලය වෙත ඉදිරිපත් කර නොමැති බැවින් ඉතිරි මුදල් පියවීමට නොහැකිවී ඇත. | ගිවිසුමට අනුව නියමිත කාල සීමාව තුළ ජල විද්‍යා අධ්‍යයනය අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අතුරු ගෙවීම් සහතිකවල ඇතුලත් ගෙවීම් අයිතම සඳහා තත්‍ය ගෙවීම් එම අයිතමවල ප්‍රමාණ පත්‍රවල ඇතුලත් අගය නොඉක්මවිය යුතු වුවද, සිවිල් වැඩ යටතේ සමහර ගෙවීම්, ප්‍රමාණ පත්‍ර අගයන් ඉක්මවා ඇති බව නිරීක්ෂණය වූ අතර එවැනි වෙනස්කම් සඳහා අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එම වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ ක්‍රියා පටිපාටිය ආරම්භ කර ඇත. | මූල්‍ය අපහසුතා වැලැක්වීම සඳහා ප්‍රමාණ පත්‍ර ප්‍රතිපාදන තුළ වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීමේ කාලය සති 72 සිට සති 26 දක්වා අඩු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් විශේෂ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර තිබුණි. තවද, ව්‍යාපෘති කාලසටහනට අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2016 දෙසැම්බර් 15 දින අවසන් කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණද, විගණිත දිනය වූ 2022 මැයි 20 දිනට පවා එවැනි ක්‍රියාවලියක් සම්පූර්ණ කර නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ඉතිරි ඉඩම් 2022 මාර්තු 30 දිනට පෙර අත්පත් කර ගැනීමට නියමිතව තිබුණු අතර 2022 මාර්තු 30 දින වන විට පුද්ගලික ඉඩම් කට්ටි 4,210 ක් අත්පත් කර ගන්නා ලදී. | ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතු අතර දිරිදීමනා යෝජනා ක්‍රමය නැවත ඇගයීමට ලක් කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගැනීමට සැලසුම් කර ඇති මුළු ඉඩම් කැබලි 6,733 න් දැනටමත් අත්පත් කර ගෙන තිබුණු පුද්ගලික ඉඩම් කැබලි සංඛ්‍යාව 4,210 ක් වුවද, පුද්ගලික ඉඩම් කැබලි 89 ක් සඳහා හිමිකම් විමර්ශන 2021 දෙසැම්බර් 31 දිනට පවා සිදු කර නොතිබූ අතර ප්‍රමාදයට හේතු විගණනයට හෙළිදරව් කර නොතිබුණි. | පුද්ගලික ඉඩම් කැබලි 4,210 ක් සැලසුම් කළ දිනට අත්පත් කර ගෙන ඇති අතර ඉඩම් කට්ටි 89 ක් සඳහා විමර්ශනද සැලසුම් කළ දිනය වූ 2022 මාර්තු 30 දිනට පෙර සිදු කර ඇත. | ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතුය. |
| (ඇ) | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කර සති 26 ක් තුළ අවසන් කිරීමට අමාත්‍යාංශයේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට එකතු වටිනාකම රු. මිලියන 30.32 ක දිරි දීමනා ගෙවා තිබුණද, 44 වගන්තිය යටතේ 2021 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට අයිතිය පැවරීමෙන් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර තිබුණේ ඉඩම් කැබලි 364 ක පමණි. | එම කටයුතු කඩිනම් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සිහි කැඳවීම් කිහිපයක් යවා ඇති අතර ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කැබලි 793 ක අයිතිය 2022 අප්‍රේල් 30 දිනට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. තවද, දිරි දීමනා ගෙවනු ලබන්නේ සමස්ත ක්‍රියාවලිය සඳහා නොව, ක්‍රියාවලියේ නිම කිරීමේ එක් එක් අදියර සඳහා වනු ඇත. | ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නියමිත කාල සීමාව තුළ අවසන් කළ යුතුය අතර දිරිදීමනා යෝජනා ක්‍රමය නැවත ඇගයීමට ලක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ලැබී තිබුණු තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය මගින් රජයේ ඉඩම් කැබලි 954 ක් ඇතුළුව ඉඩම් කැබලි 6,733 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. එයින් ඉඩම් කැබලි 3,535 ක් සඳහා පමණක් රු. මිලියන 6,704 ක් වන්දි වශයෙන් ගෙවා ඇති අතර 2021 දෙසැම්බර් 31 වන විට ඉඩම් කැබලි 2,430 ක් සඳහා පමණක් රු. මිලියන 658.8 ක් ප්‍රමාද පොලිය ලෙස ගෙවා තිබුණි. එබැවින් වන්දි ගෙවීමේ ප්‍රමාදය ඉඩම් හිමියන්ට පොලී ගෙවීම සම්බන්ධයෙන් ඍජුවම බලපාන අතර එම නිසා රජයට මූල්‍යමය අපහසුතාවයක් ඇතිවන බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුවල ප්‍රමාණවත් ප්‍රතිපාදන පවතින බැවින් ඉඩම් අහිමි වූ ජනතාවට වන්දි ගෙවීමට ප්‍රමාණවත් මුදල් අපි බොහෝ විට ඉල්ලා සිටියද, මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සම්පූර්ණ වන්දි ගෙවීමට නොහැකි වූ අතර වන්දි මුදල්වල ඉතිරි ගෙවීම් ප්‍රමාද වීම නිසා පොලී සමඟ ගෙවීමට සිදු විය. මෙවැනි ගනුදෙනු ව්‍යාපෘතියට පාලනය කළ නොහැකි වේ. | වන්දි ගෙවීමේ අසාමාන්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ වන්දි සඳහා ප්‍රමාද පොලී ගෙවීම සීමා කිරීමට අරමුදල් සම්පාදනය විධිමත් කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් 2021 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවට තනතුරු 80 ක් ඇතුළත් කර තිබුණද, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ I කොටසට අනුයුක්ත කර ඇති නිශ්චිත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අධිවේගී මාර්ගයේ එක් එක් කොටසේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වෙන් කර ඇත. | මධ්‍යම අධිවේගී මාර්ගයේ සෑම කොටසකටම වෙනම අරමුදල් සම්පාදකයින් සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකක ඇත. එබැවින් එක් එක් කොටස සඳහා වෙනම සේවක සංඛ්‍යාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ යුතුය. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.2 වගන්තියට අනුව, ව්‍යාපෘති කළමනාකරණය ඵලදායීව සිදුකිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතු වුවද, චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වැඩබලන පදනම මත බඳවාගෙන තිබුණි. | අප විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ලක් කර ඇති අතර නුදුරේදීම ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා අපට සුදුසුකම් ලත් පළපුරුදු අයදුම්කරුවෙකු තෝරා පත් කර ගැනීමට හැකි වනු ඇත. | චක්‍රලේඛ උපදෙස් දැඩිව අනුගමනය කළ යුතුය. |
| (ඇ) | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, ප්‍රසම්පාදන විශේෂඥ, ක්ෂේත්‍ර ඉංජිනේරු, කාර්යාල ඉංජිනේරු, සැලසුම් ඉංජිනේරු, ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරී, මිනින්දෝරු ආදී තීරණාත්මක තනතුරුවල පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. එබැවින් එම පුරප්පාඩු | ව්‍යාපෘති කාර්යයන්ගේ අවශ්‍යතාවය මත පදනම්ව ව්‍යාපෘතිය මගින් කරන ලද ඉල්ලීම් අනුව අපි කලින් කලට අවශ්‍ය කාර්ය මණ්ඩලය පත් කර ඇති අතර අනුමත සේවක සංඛ්‍යාවට අනුව කාර්ය | ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවාගත යුතුය. |

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ කාර්යසාධනයට සෘජුවම බලපෑ හැකි බව විගණනයට නිරීක්ෂණය විය. | මණ්ඩලය පත් කිරීමට පෙර ව්‍යාපෘතියේ සේවක සංඛ්‍යා අවශ්‍යතා අපි දැඩිව නිරීක්ෂණය කරමු. එබැවින් එය ව්‍යාපෘතියේ කාර්යසාධනයට බලපෑමක් ඇති නොකරනු ඇත. | |
| (ඇ) | ඉඩම් අත්පත් කර ගැනීමේ විශේෂඥයින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකක කාර්ය මණ්ඩලය ලෙස මූලික අදියරේ දී බඳවා ගත යුතු වුවද, උපදේශක කාර්ය මණ්ඩලය යටතේ විශේෂඥයින් දෙදෙනෙකු බඳවාගෙන තිබුණු අතර උපදේශන සේවා ගෙවීම් යටතේ 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.4 ක සමුච්චිත මුදලක් ගෙවා තිබුණි. උපදේශක සේවා ගෙවීම් යටතේ ගෙවීම් සඳහා සියයට 10 ක උපදේශක පොදු කාර්ය පිරිවැයක් අයකර ගැනීම හේතුවෙන් ව්‍යාපෘතියට අමතර පිරිවැයක් දැරීමට සිදුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘතිය ආරම්භයේ සිට ඉඩම් නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කළහොත් දීර්ඝ කාලයක් ගත වන අතර දීර්ඝ කාලයක් වැටුප් ගෙවීමටද සිදුවේ. එබැවින් එවැනි බඳවා ගැනීම් ඉංජිනේරු කාර්ය මණ්ඩලය හරහා සිදු කරනු ලබන අතර අදාළ කටයුතු අවසන් කිරීමෙන් පසු සේවය අවසන් කරනු ලැබේ. මෙය ව්‍යාපෘතිය සඳහා වඩාත් ඵලදායී හා ආර්ථික වශයෙන් සුදුසු වනු ඇත. | ව්‍යාපෘති පිරිවැය ආර්ථිකභාවයෙන් යුතුව පවත්වාගෙන යා යුතුය. |

## 4. පද්ධති හා පාලනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක. 01/2019 හි 9.3 ඡේදයට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් කමිටුව රැස්වී තිබුණේ 2021 නොවැම්බර් 30 දින පමණක් බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු (PSC) රැස්වීම් මාසිකව පැවැත්වීම අතිශයින්ම අවශ්‍ය වුවද; රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය, රට වසා දැමීම, කොන්ත්‍රාත්කරුගේ සහ ඉංජිනේරුවරයාගේ කාර්ය මණ්ඩලයට කොවිඩ් ආසාදනය වීම සහ විවිධ චක්‍රලේඛ උපදෙස් හේතුවෙන්, ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාසිකව පැවැත්විය නොහැකි විය. | ව්‍යාපෘතියේ නිසි ක්‍රියාකාරිත්වය සඳහා චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු පැවැත්විය යුතුය. |